# නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
## නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන
*ජාතියේ අවශ්‍යතාවය වන ශ්‍රී ලාංකේය නිපුණතාවයන් තහවුරු කිරීම සඳහා කොටස්කරුවෙකු වන්න.*

## පුරප්පාඩු

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත්, පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**විශේෂ සටහන : ඉහත පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් 2017.10.25 දින පළ කරන ලද පුවත්පත් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.**

PS 3 **මට්ටම** (**කළමනාකරණ සේවා චක්‍රලේඛ** 01/ 2016, 01/ 2016 (I) **අනුව**)

| **අංකය** | **තනතුර** | **සුදුසුකම්** - (**පහත** 1**හෝ** 2 **හෝ** 3) | **තෝරා ගැනීමේ ක්‍රමවේදය** | **මාසික වැටුප** |
|---|---|---|---|---|
| 01 | මූල්‍ය විශ්ලේෂක (පුරප්පාඩු 01) | 1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන යැයි පිළිගත්, අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ සුදුසුකම්<br>හෝ<br>පිළිගත් වෘත්තීය ආයතනයකින් (Recognized Professional Institute) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ වෘත්තීය සුදුසුකම් (Professional Qualifications) සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**සමඟ**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 07ක් ඇතුළත් අවම වශයෙන් **වසර** 14 **ක** පශ්චාත් සුදුසුකම (Post Qualifying Experience) සහිත කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද<br><br>2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් | සුදුසුකම් හා පළපුරුද්ද අනුව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. | රු. 180,000.00 හා ජීවන වියදම් දීමනාව |

| | | | | |
|---|---|---|---|---|
| | | සභාව විසින් උපාධියට සමාන යැයි පිළිගත්, අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ සුදුසුකම්<br><br>හෝ<br><br>පිළිගත් වෘත්තීය ආයතනයකින් (Recognized Professional Institute) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ වෘත්තීය සුදුසුකම් (Professional Qualifications) සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br><br>**සහ**<br><br>පශ්චාත් උපාධිය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය<br>**සමඟ**<br>අවම වශයෙන් **වසර** 12 ක පශ්චාත් සුදුසුකම් (Post Qualifying Experience) සහිත කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.<br><br>3) රජයේ දීප ව්‍යාප්ත සේවයන්හි I පන්තියේ නිළධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්වයක්<br>**සමඟ**<br>I පන්තියේ තනතුරක අවම වශයෙන් **වසර** 11 ක පළපුරුද්ද | | |

**සටහන:** තනතුරට අදාළ සේවා කොන්දේසි (Terms of Reference (TORs) නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ www.ssdd.lk වෙබ් අඩවිය මගින් බාගත කර ගත හැක.

**වයස** : 2017.12.04 **දිනට වයස අවු**. 64 **ට අඩු විය යුතුය**.

**වැටුප් පරිමාණය**:

2016.03.24 දිනැති අංක 01/ 2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව වැටුප් පදනම් වේ. ඒ අනුව, රජයේ දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් ඉහත තනතුරු සඳහා පත්කෙරෙන නිලධාරීන් සඳහා දැනට ලබන වැටුප සහ අදාළ වරප්‍රසාදවලට අමතරව, වැඩසටහනෙහි අදාළ තනතුරේ මූලික වැටුපෙන් 50% ක දීමනාවක් ලබාදේ. තවද, ඉහත තනතුරු සඳහා රජයේ දීපව්‍යාප්ත සේවාවලින් පරිබාහිරව බඳවාගන්නා නිලධාරීන් සඳහා ඉහත එක් එක් තනතුරට අදාළව සඳහන් කර ඇති පරිදි වැටුප් ලබාදේ.

**සේවා කොන්දේසි**:

දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අයත්වන නිලධාරීන් ස්ථානමාරු පදනම මත පත්කෙරෙන අතර, රජයේ සේවයෙන් පරිබාහිර පුද්ගලයන් කොන්ත්‍රාත් පදනම මත පත්කෙරේ. සියළුම පත්වීම් ආරම්භක වශයෙන් එක් අවුරුද්දක් සඳහා සිදු කෙරෙන අතර, සතුටුදායක කාර්යසාධන ඇගයීමක් යටතේ වාර්ෂිකව දීර්ඝ කිරීම සිදුකළ හැක. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016, 01/2016 (I) හි සියළුම කොන්දේසි පත්වීම් කිරීම් සම්බන්ධයෙන් අදාළ වේ.

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ www.ssdd.lk වෙබ් අඩවිය මගින් අයදුම්පත් බාගත කර ගත හැකි අතර, යෝග්‍යතාවයන් සනාථ කිරීම පිණිස අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතිකපත්වල පිටපත්ද සමඟ සියළුම අයදුම්පත්, **අතිරේක ලේකම් (නි.ආ.ස.)**, **නිපුණතා ආංශික සංවර්ධන අංශය**, **නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**, **අංක** 354 /2, "**නිපුණතා පියස**", **ඇල්විටිගල මාවත**, **නාරාහේන්පිට**, **කොළඹ** 05 යන ලිපිනයට 2017.12.04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. රාජ්‍ය / සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

**ලේකම්**
**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**,
අංක 354/2, "නිපුණතා පියස",
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05